කොබෙයිගනේ ප්‍රාදේශීය සභාව
කුරුණෑගල දිස්ත්‍රික්කය

**01.** **මූල්‍ය ප්‍රකාශන**

-----------------

**1.1** **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

----------------------------------

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජූලි14 දිනද, විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජූලි 17 දිනද සභාපතිවරයාට යවා ඇත.

**1.2** **තත්ත්වාගණනය කළ මතය**

---------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට කොබෙයිගනේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්ව සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3** **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

------------------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයට අදාළව විගණන ගාස්තු සඳහා වෙන් කිරීම් සිදු කර නොතිබුණි. | විගණන ගාස්තු සඳහා වෙන් කිරීම් සිදු කළ යුතු වේ. | ඉදිරි වසරේ සිට විගණන ගාස්තු සඳහා මුදල් වෙන් කිරීමට කටයුතු කරමි. |
| (ආ) | ප්‍රාදේශීය සභා නව ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා 2018 හා 2019 වර්ෂවල දරන ලද රු.19,568,370 ක් ගිණුම්වලින් අත්හැරී තිබුණි. | ගිණුම්වලට අවශ්‍ය ගැලපීම් කළ යුතු වේ. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනය සැකසීමේදී එම වටිනාකම ජ'නල් සටහනක් මඟින් නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඇ) | මෝටර් ග්‍රේඩර් යන්ත්‍රයක් මිලදී ගැනීමට දරන ලද රු.409,500 ක් මෝටර් රථ හා කරත්ත යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | ගිණුම්වලට අවශ්‍ය ගැලපීම් කළ යුතු වේ. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනය සැකසීමේදී එම වටිනාකම ජ'නල් සටහනක් මඟින් නිවැරදි කිරීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට සේවක ණය ශේෂයන්හි මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය හා උපලේඛන අනුව ශේෂය අතර රු. 298,424 ක වෙනසක් පැවතුණි. | වෙනසට හේතූන් සොයා බලා අවශ්‍ය ගැලපීම් කළ යුතු වේ. | ඉදිරියේදී නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. |
| (ඉ) | උපලේඛන ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.39,177,942 ක් වූ යන්ත්‍රෝපකරණ, ලී බඩු හා සවි කිරීම් සහ පුස්තකාල පොත් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශනවලදැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. | මූල්‍ය ප්‍රකාශනය ගොනු කිරීමේදී යන්ත්‍රෝපකරණ උපලේඛනය හා ලී බඩු හා සවිකිරීම් උප ලේඛනය මගහැරී ඇති බව කාරුණිකව දන්වමි. |
| (ඊ) | එකතුව රු.110,526,325 ක්වූ ගොඩනැගිලි සඳහා වටිනාකම් සහිතව නිසි පරිදි උපලේඛන යාවත්කාලීන කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවලදැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. | ඉදිරියේදී ගොඩනැගිලි වටිනාකම් නිවැරදිව යාවත්කාලීන කිරීමට කටයුතු කරන බව දන්වමි. |

## 02. මූල්‍ය සමාලෝචනය

------------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්මවූ වියදම රු.8,059,313 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.6,813,092 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

----------------------

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ අදායම්

---------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2019වර්ෂය ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2018 වර්ෂය ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 1,475,885 | 1,684,972 | 1,539,434 | 505,077 | 1,320,385 | 1,621,278 | 1,546,870 | 359,540 |
| බදු කුලී | 3,577,045 | 3,696,373 | 3,667,016 | 60,038 | 3,535,295 | 3,870,278 | 3,841,602 | 30,682 |
| බලපත්‍ර ගාස්තු | 1,389,100 | 1,239,320 | 1,239,320 | - | 1,029,100 | 1,191,874 | 1,191,874 | - |
| වෙනත් ආදායම් | 13,511,288 | 42,842,700 | 43,214,355 | 13,733,467 | 46,534,100 | 45,544,898 | 76,313,174 | 14,105,121 |
| එකතුව | 19,953,318 | 49,463,365 | 49,660,125 | 14,298,582 | 52,418,880 | 52,228,328 | 82,893,520 | 14,495,343 |

**2.2.2 වරිපනම් හා බදු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු වරිපනම් හා බදු හිගය රු.484,551ක් විය. | ප්‍රාදේශීය සභා රීති ප්‍රකාරව හිඟ ශේෂ අය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | මෙම හිග මුදලින් රු:73,129 ක මුදලක් අයකරගෙන ඇති අතර ඉතිරි මුදලද අයකරගැනිමට කටයුතු කරමි. |
| (ආ) 2019 දෙසැම්බර් 31 දිනට රු.20,526 ක අක්කර බදු මුදලක් අයවිය යුතුව පැවතුණි. | ප්‍රාදේශීය සභා රීති ප්‍රකාරව හිඟ ශේෂ අය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | හිඟ මුදල අයකර ගැනිමට කටයුතු කරන බව දන්වමි. |

2.2.3 කුලී

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) කොබෙයිගනේ බස් නැවතුම වෙළඳ සංකීර්ණයේ කඩ කාමරයක්වෙනත් පාර්ශවයකට පවරා දී වසර 4 ක කාලයක් ගතවී තිබුණද නව බදුකරු සමඟ ගිවිසුමකට එළඹීමට කටයුතු කර නොතිබුණි. | අතුරු බදුදීම් සම්බන්ධයෙන් පළාත් පාලන කොමසාරිස් (වයඹ) චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | මේ වන විට චමිලා ජයමාලි නමින් A-1කඩ කාමරයසඳහා මුදල් ගෙවන අතරනව ගිවිසුමකට එළඹීමට කටයුතු කරන බව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සභාව සතු වත්කම් 04ක් 2019 වර්ෂයට බදු නොදීම හේතුවෙන්රු.25,650 ක ආදායමක් අහිමි වී තිබුණි. | දීර්ඝකාලීනව බදුදිය නොහැකි වත්කම් වෙනත් ඵලදායී කටයුත්තකට යොදාගෙන ආදායම් ඉපැයීමට කටයුතු කළ යුතු වේ. | ඉල්ලුම්කරුවන් ඉදිරිපත් නොවීම හේතුවෙන් බදු දීමට නොහැකි වූ බව දන්වමි. |

2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

-------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරින්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.2,000,000 ක් හා මුද්දර ගාස්තු රු.6,520,000 ක් විය. | ලැබිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු අය කරගෙන අයවැයගත වියදම් දැරීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී මෙම මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව දන්වමි. |

03. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

3.1 කාර්යය සාධනය

--------------------

ප්‍රාදේශිය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය සඳහා සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2018 දෙසැම්බර් 31 දින වන විට සම්මත අතුරු ව්‍යවස්ථාවට අමතරව පළාත් පාලන විෂයභාර අමාත්‍යාංශය විසින් සාදන ලද අතුරු ව්‍යවස්ථා දෙකක් සභාව විසින් වැළඳගෙන තිබුණි. | සභාව විසින් වැළඳගත්/ පැනවූ අතුරු ව්‍යවස්ථා අනුව කටයුතු කළ යුතු අතර අවශ්‍යතාවය අනුව නව අතුරු ව්‍යවස්ථා පනවා ගැනීමට කටයුතු කළ යුතු වේ. | නව අතුරු ව්‍යවස්ථා සම්පාදනය කර ගැනීම සඳහා මේ වන විටත් කටයුතු සම්පාදනය කරගෙන යනු ලැබේ. |

(ආ) පාරිසරික ගැටළු

----------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළබලපත්‍ර ලබා ගත යුතු වෙළඳ ආයතන 29 ක් බලපත්‍ර ලබාගෙන නොතිබුණි. | බලපත්‍ර ලබාගත යුතු වෙළඳ ස්ථානවලට බලපත්‍ර නිකුත් කළ යුතු වේ. | බලපත්‍රලාභීන්ට බලපත්‍ර අලුත්කර ගන්නා ලෙස දන්වා ඇත. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2019 දෙසැම්බර් 31 දිනට වර්ෂ 01 ත්03 ත් අතර වූ රු.331,659ක්සහ වර්ෂ 03 ට වැඩි රු.158,252 ක් වූ ලැබිය යුතු හිඟ මුදල් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ලැබිය යුතු ශේෂ අය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | හිග මුදල් අයකර ගැනිමට කටයුතු කරන බව දන්වමි. |

| | | |
|---|---|---|
| (ආ) 2019 දෙසැම්බර් 31දිනට වර්ෂ 01-03 ත් අතර වූ රු.973,532 ක් හා වර්ෂ 3 ට වැඩි රු.2,715,615 ක් වූ ගෙවිය යුතු මුදල්නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. | ගෙවිය යුතු ගිණුම් නිරවුල් කිරිමට කටයුතු කරමි. |

3.3 මානව සම්පත් කළමනාකරණය

-----------------------------------

සේවක පුරප්පාඩු හා අතිරික්ත

--------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කාර්යමණ්ඩලයේ ද්විතීයික හා ප්‍රාථමික සේවාවන්ට අදාළව පුරප්පාඩු 7 ක් හා අතිරික්තතා 5 ක් පැවතුණි. | පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට හා අතිරික්ත විධිමත් කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | පුරප්පාඩු 02 ක් සම්බන්ධයෙන් පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙත හා ප්‍රධාන ලේකම් කාර්යාලය වෙත දැනුම් දී ඇති බවත් කම්කරු තනතුරු සඳහා බඳවා ගැනිමට අදාළ කටයුතු සිදු කරමින් පවතින බවත්දන්වමි. |

3.4 වත්කම්කළමණාකරණය

-----------------------------

3.4.1 පවරා නොගත් වත්කම්

---------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභා කාර්යාලය, මහජන පුස්තකාලය,ක්‍රීඩා පිටිය හා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය පිහිටි අක්කර 06 ක් පමණ වූ ඉඩම හා කැබ් රථයක් සභාවට පවරා ගෙන නොතිබුණි. | අදාළ වත්කම් පවරාගැනීමටකටයුතු කළ යුතු වේ. | සභා කාර්යාලය, මහජන පුස්තකාලය, ක්‍රීඩා පිටිය හා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය පිහිටි අක්කර 06 ක ඉඩම පවරා ගැනීමට අදාළ සියළු කටයුතු මේවන විට සිදුකර ඇති බවදන්වමි. |

3.4.2 නිශ්ක්‍රීය / ඌණ උපයෝජිත වත්කම්

-------------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දිනට ශේෂ එකතුව රු.91,057 ක් වූ ජංගම බැංකු ගිණුම් දෙකක් වසර 02 කට අධික කාලයක් තිස්සේ අක්‍රීය තත්ත්වයේ පැවතුණි. | අක්‍රීය ගිණුම් වසා දැමීමට හෝ සක්‍රීයව පවත්වා ගෙන යාමට කටයුතු කළ යුතු වේ. | මෙම ජංගම ගිණුම් දෙකම ඉදිරියේදී සක්‍රීයව පවත්වාගෙන යාමට කටයුතු කරන බවදන්වමි. |

3.5 හඳුනා නොගත් පාඩු

--------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභාවට අයත් බැකෝ ලෝඩරය 2019 අගෝස්තු 05 දින අනතුරට පත්වීම නිසා අලාභය රු.98,386 ක් වූ අතර එයින් රු.34,900 ක් රක්ෂණයෙන් ආවරණය වී නොතිබුණි.තවද මෙහි වගකිව යුත්තන් නිශ්චය කිරීම සඳහා මු.රෙ. 104 යටතේ පරීක්ෂණයක් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කර වගකිව යුත්තන් නිශ්චය කළ යුතු වේ. | මෙම සිදුවීම සම්බන්ධයෙන් රියදුරු පවසා සිටියේ රිය සහායකු නොසිටි බැවින් මෙමඅනතුර සිදුවූ බවයි.අදාළ රක්ෂණ සමාගම දැනුවත් කර තක්සේරුවක් ලබාගත් අතර එය රක්ෂණ සමාගම වෙත ඉදිරිපත් කළ පසු ඔවුන්ගේ රක්ෂණ හිමිකම් සහතිකයේ ඇති නීතිමය තත්ත්වය මත 10% ක මුදලක් නොගෙවන බව පැවසූ බැවින් එය සභා අරමුදලින් ගෙවීම සඳහා අනුමත කර ගන්නා ලදී.ඉදිරියේ මු.රෙ.104 ප්‍රකාරව කටයුතු කරන බව දන්වමි. |

3.6 ප්‍රසම්පාදන

---------------

ප්‍රසම්පාදන සැලැස්ම

----------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අයවැයගත සැපයුම් හා සේවා ආවරණය වන පරිදි ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්ම යාවත්කාලීන කර ඒ අනුව මිලදී ගැනීම් කළ යුතු වේ. | අයවැයගත සැපයුම් හා සේවා ආවරණය වන පරිදි ප්‍රසම්පාදන සැළැස්මක් පිළියෙල කරන බව දන්වමි. |

04. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

---------------------------------------------

අභ්‍යන්තර විගණනය

-------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 අප්‍රේල් 30 දිනෙන් පසු අභ්‍යන්තර විගණන වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. | අභ්‍යන්තර විගණන කටයුතු සිදුකර එම වාර්තා විගණනයට ඉදිරිපත් කළ යුතු වේ. | ඉදිරියේදි අභ්‍යන්තර විගණන වාර්තා මාසිකව ඉදිරිපත් කිරිමට කටයුතු කරන බව දන්වමි. |